**CENTRE FOR MONITORING ELECTION VIOLENCE**
**මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය**
**தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்**
No 6/5, Layards Road, Colombo 05, **Tel:** +094-11 3010664
**Fax**: +094-11 2505228 **E-mail**: cmev@cpalanka.org **Web**: www.cmev.org

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2018

## මාධ්‍ය නිවේදනය - 01

*2018 ජනවාරි මස 01 වැනි දිනඃ මධ්‍යාහ්න 12.00 පැය , කොළඹ , ශ්‍රී ලංකාව*

වසර කිහිපයක් තිස්සේ දිනෙන් දින විවිධ හේතුමත කල් යමින් තිබූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වීමේ දිනය මැතිවරණ කොමිෂන් සභාව නිල වශයෙන් ප්‍රකාශයට පත්කොට ඇත. ඒ අනුව මෙරටේ ඡන්දදායකයන් ඉමහත් අපේක්ෂාසහගතව සිටි මැතිවරණ දිනය ලෙස ප්‍රකාශයට පත්ව ඇත්තේ වසර 2018 පෙබරවාරි මස 10 වැනි සෙනසුරාදා දිනයි.

අවසන් වරට පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පවත්වන ලද්දේ අදියර තුනක් යටතේදී ය. ඒ පහත පරිදි ය.

පළමු අදියර - වසර 2011-03-17

දෙවන අදියර - වසර 2011-07-23

තෙවන අදියර - වසර 2011-08-10

මින් පළමු අදියරෙහි ඡන්ද විමසීම පවත්වන ලද්දේ එවකට මැතිවරණ කොමසාරිස්වරයා වූ දයානන්ද දිසානායක මහතා යටතේ ය. පළමු අදියර නිමාවීමත් සමඟ විශ්‍රාම ලැබූ දයානන්ද දිසානායක මහතා වෙනුවට ඡන්ද විමසීමේ ඉතිරි අදියර දෙක පවත්වන ලද්දේ මැතිවරණ කොමසාරිස්වරයා ලෙස පත්වූ මහින්ද දේශප්‍රිය මහතා යටතේ ය. එකී මැතිවරණයේ සුවිශේෂත්වය වූයේ එය එවකට සිටි මැතිවරණ කොමසාරිස්වරයා යටතේ පවත්වන ලද අවසන් මැතිවරණය මෙන්ම සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ සභිකයන් තෝරා පත්කර ගන්නා ලද අවසන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම වීමයි.

මෙරටේ අවසන් වරට පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පවා එතෙක් පැවති ක්‍රමය වෙනස් කොට කේවල හා සමානුපාතික ක්‍රම දෙකෙහි සම්මිශ්‍රණය යටතේ පැවැත්විය යුතු යැයි රජය යම් තීරණයක් ගෙන තිබුණ ද පසුව එය සමානුපාතික ක්‍රමය යටතේ ම පැවැත්විණි. එකී ඡන්ද විමසීමෙදී ද දිවයිනේ කවර ඡන්ද මධ්‍යස්ථානයක හෝ වේවා ස්ථිතික මෙන්ම ජංගම නිරීක්ෂකයන් යෙදවීමේ අවසරය මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) හා නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ක්‍රියාකාරීත්වය (PAFFREL) යන ආයතන දෙක වෙත පිරිනමා තිබුණි.

ඒ අනුව එකී ඡන්ද විමසීම අදියර 3ක් යටතේ පවත්වා අවසන් වන විට ප්‍රතිඵලය දක්වුනේ එක්සත් ජනතා නිදහස් සන්ධානය ඡන්ද 4,774,791 ක් ලබා පළාත් පාලන ආයතන 271 ක බලය හිමිකර ගැනීමෙනි. ඒ පළාත් පාලන ආයතන 322 ක් අතුරෙනි.

එකී ඡන්ද විමසීමේදී ඒ ඒ පක්ෂය හා ස්වාධීන කණ්ඩායම් විසින් පාලන බලය හිමිකර ගත් පළාත් පාලන ආයතන සංඛ්‍යාව පහත දක්වා ඇත.

| *පක්ෂයේ නම/ ස්වාධීන කණ්ඩායම* | *මහ නගර සභාව* | *නගර සභාව* | *ප්‍රාදේශීය සභාව* | *එකතුව* |
|---|---|---|---|---|
| **එක්සත් ජනතා නිදහස් සන්ධානය** | 17 | 29 | 225 | 271 |
| **ඉලංකෙයි තමිල් අරසුකච්චි** | - | 5 | 25 | 30 |
| **එක්සත් ජාතික පක්ෂය** | 2 | 5 | 3 | 10 |
| **ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය** | 1 | - | 4 | 5 |
| **ජාතික කොංග්‍රසය** | 1 | - | 1 | 2 |
| **ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ** | - | - | 2 | 2 |
| **කඳුරට ජනතා පෙරමුණ** | - | - | 1 | 1 |
| **ස්වාධීන කණ්ඩායම** | - | - | 1 | 1 |
| **එකතුව** | **21** | **39** | **262** | **322** |

පළාත් පාලන ආයතනයක නිල කාලසීමාව වසර හතරක් (04) පමණක් වුවද මෙවර ඡන්ද විමසීම පැවැත්වීමට නියමිතව ඇත්තේ නියමිත කාලසීමාව ද බොහෝ සෙයින් ඉක්මගිය පසුබිමක් තුළය. මෙවර පළාත් පාලන ඡන්ද විමසීම මෙලෙස අඛණ්ඩව ප්‍රමාදවීම සඳහා බලපෑ කරුණු බොහෝ ය. එහිලා ප්‍රමුඛතම සාධකය වූයේ නව මැතිවරණ ක්‍රමය හා ඉන් යෝජිතව තිබූ පළාත් පාලන ආයතන සීමා නිර්ණ ක්‍රියාවලියයි. ඊට සමගාමීව විවිධ දේශපාලන පක්ෂ අනුදත් ප්‍රායෝගික භාවිතාවන් මෙන්ම ඒවායේ දේශපාලනික අභිලාෂයන් ද මෙම ප්‍රමාදය සඳහා තීරණාත්මකව හේතු විය.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය ඒ පිළිබඳ වරින්වර කරුණු දක්වමින් තම බලවත් විරෝධය දැක්වීය. එහිලා වඩාත් අවධානයට ලක් වූ පාර්ශවය වූයේ මැතිවරණ කොමිෂන් සභාවයි. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ බලතල ප්‍රකාරව පිහිටුවනු ලැබූ එකී කොමිෂන් සභාව, මෙම ඡන්ද විමසීම වහාම පැවැත්වීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු යැයි සමහර පිරිස් තර්ක කරන ලදි. තවද මැතිවරණ කොමිෂන් සභාව හිතාමතා ම මෙම ඡන්ද විමසීම ප්‍රමාද කරන්නේය යන්න පොදු ජනතාව අතර ද ප්‍රචලිතව තිබූ මතය විය. දේශපාලන පක්ෂ බොහෝමයක් ද එකී මතය තහවුරු වන ලෙස කටයුතු කළා විණා සැබෑ තතු හෙළි කිරීමේ ස්ථාවරයක පසු නොවීම නිරීක්ෂණ සංවිධානයක් ලෙස අප දකිනුයේ ඉතා අවාසනාවන්ත තත්ත්වයක් ලෙසිනි.

එලෙස මෙරටේ කිසිදු දේශපාලන පක්ෂයක් හෝ වෙනත් දේශපාලන කණ්ඩායමක් නිවැරදිව ඡන්දදායකයන් හට ප්‍රකාශ නොකරන ලද සැබෑ හේතුව වූයේ පළාත් පාලන ඡන්ද විමසීමට අදාළ දිනය තීරණය කිරීමට ප්‍රථම, පළාත් පාලන ආයතන විෂය භාර රේඛීය අමාත්‍යාංශය වන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය කඩිනමින් සිදුකළ යුතු කාර්යභාරයක් පැවති බවයි. එනම් නව සභිකධූර සංඛ්‍යා දක්වා පළාත් පාලන ආයතන සංස්ථාපනයට අදාළ ගැසට් පත්‍රය මුද්‍රණය කොට ප්‍රසිද්ධ කිරීමයි.

යම් පළාත් පාලන ආයතනයකට හිමි නිශ්චිත සභිකධූර සංඛ්‍යාව කවරේදැයි යන්න අදාළ රේඛීය අමාත්‍යාංශය වන පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශය අතිවිශේෂ ගැසට් පත්‍රයක් ඔස්සේ ප්‍රසිද්ධ කොට පාර්ලිමේන්තුව මගින් අනුමත නොකරන තාක්කල්, ඡන්ද විමසීම පැවැත්වීම සඳහා දින නියම කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාව සතුව නොමැත. ඊට හේතුව වන්නේ මිශ්‍ර මැතිවරණ ක්‍රමයක් පාදක කර ගත් නවමු ක්‍රමවේදයක් යටතේ මෙවර පළාත් පාලන ඡන්ද විමසීම පැවැත්වීමත් එකී කරුණ හේතුවෙන් සෑම පළාත් පාලන ආයතනයක ම සභිකධූර සංඛ්‍යාව වෙනසකට ලක්වීමත් ය.

සංස්ථාපන නියම ලෙස දැක්වෙන මෙම ගැසට් පත්‍රය අදාළ රේඛිය අමාත්‍යාංශය මගින් ප්‍රකාශයට පත්කිරීම වරින්වර ප්‍රමාද වූවා පමණක් නොව එකී ප්‍රමාදය ඉතා අසාමාන්‍ය එකක් වූ බව ඒ පිළිබඳ සමීප නිරීක්ෂණයක යෙදුණ කවරෙකුට හෝ වටහා ගැනීමේ අපහසුතාවක් නැත.

එකී කරුණු පිළිබඳව අවධානය යොමු කිරීමේදී මෙරටේ සිවිල් සමාජ මෙන්ම පුරවැසියන් වඩාත් ප්‍රෝත්සාහී විය යුත්තේ මැතිවරණ කොමිෂන් සභාව වෙත ඊට නිරායාසයෙන්ම අයත් විය යුතු බලතල ලබාදීම සඳහා යම් හඬක් නැගීමටය. එහිලා වඩාත් වැදගත් වන්නේ නියමිත පරිදි මැතිවරණ පැවැත්වීම සඳහා (Scheduled Elections) මැතිවරණ කොමිෂන් සභාව වෙත අවැසි බලතල ලබාදීම වන අතර එහිලා ඉන්දීය මැතිවරණ කොමිසම ආදර්ශයට ගත හැකි ඉතා සමීපතම රාජ්‍යයයි.

මෙම පසුබිම තුළ මෙවර පළාත් පාලන ඡන්ද විමසීම අතිශය තීරණාත්මකය. එය එක් පසෙකින් මෙරටේ අනාගත මැතිවරණ ක්‍රියාවලියේ දිශානතිය සටහන් කරන්නා සේම මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යසාධනය පිළිබඳ පළමු අත්දැකීම ද වන්නේ ය. එපමණක් නොව මිශ්‍ර සභික සමානුපාතික නියෝජන ක්‍රමය මෙරටේ පළමු වරට පරීක්ෂාවට ලක්කරන මැතිවරණය වන්නේ ද මෙයයි.

ඡන්ද මධ්‍යස්ථාන 13,000 කට මඳක් අධික සංඛ්‍යාවක් උපයෝගී කරගනිමින් පළාත් පාලන ආයතන 341 ක බලය ලබා ගැනීම සඳහා අපේක්ෂකයන් 56,000 කට මඳක් අධික ප්‍රමාණයක් තරඟ වදින මෙම ඡන්ද විමසීම පැවැත්වීම සඳහා මැතිවරණය කොමිෂන් සභාව දැරිය යුතු අවම පිරිවැය රුපියල් මිලියන 3500 ක් වන්නේය.

වසර 2012 දී හඳුන්වා දෙන ලද අංක 22 දරණ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත මඟින් ජනිත නව මැතිවරණ ක්‍රමය මෙරටේ අනාගත මැතිවරණ ක්‍රමයේ හැඩරුව සනිටුහන් කරනු ලබන හැරවුම් ලක්ෂයක් වේයැයි ප්‍රකාශ කිරීමට තවමත් වේලාසන වැඩිය. එහෙත් එය නිසැකවම මෙරටේ පුරවැසියන් වෙත නව මානයක් උදාකර ඇත්තේය. එනම් සමීප නියෝජනයක් සහිත කුඩා ම දේශපාලන ඒකකය කොට්ඨාශය නමින් මෙරටේ ස්ථාපිත වීමයි. මේ අනුව සියයට සියයක් ම (100%) සමානුපාතික ක්‍රමවේදයක් යටතේ තේරීපත් වීමට නියමිත සභිකයන් 8356 ක් පමණ වූ අවම මහජන නියෝජිතයන් පිරිසක් 341 ක් පමණ වූ පළාත් පාලන ආයතන ප්‍රමාණයක් නියෝජනය කරමින් පත් වීමට නියමිතව ඇත.

එය පෙර සභික ධූර හා සැසඳීමේදී නිසැකව ම සභිකධූර ප්‍රමාණය සංඛ්‍යාත්මකව දෙගුණයකට මඳක් අධික ප්‍රමාණයකින් ඉහළ යන්නේ වුවද, එය රටේ අභිවෘද්ධිය උදෙසා කළ ඵලදායී දේශපාලන ආයෝජනයක් වනු ඇත්තේ එකී සෑම සභිකයෙක් ම තම කාර්යයසාධනය තුළින් විදහාපාන කාර්යය සාපල්‍යත්වයේ පරිමාව අනුවය.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය මෙවර ද තම නිරීක්ෂණ කටයුතු සාමාන්‍ය පරිදි අරඹා ඇති අතර එය දෙයාකාර ප්‍රවේශයකින් යුත්තය. එක් පසෙකින් සමස්ථ පරිපාලන දිස්ත්‍රික්ක විසිපහ ම (25) ආවරණය වන සේ ස්ථානගත කරන ලද දිස්ත්‍රික් හා ක්ෂේත්‍ර නිරීක්ෂකයන් දිගු කාලීන නිරීක්ෂකයන් (Long Term Observers) ලෙස කටයුතු කරනු ඇත. ඒ හා සමගාමීව මැතිවරණ දිනයේ ස්ථානගත නිරීක්ෂකයන් හෙවත් ස්ථිතික නිරීක්ෂකයන් විශාල ප්‍රමාණයක් ද ඡන්ද මධ්‍යස්ථාන තුල රැඳවීමට නියමිතය. ඒ එම දිනය තුල සමස්ත දිවයින ම ආවරණය වන පරිදි යොදවන ජංගම නිරීක්ෂණ රථ මඟින් සිදුවන නිරීක්ෂණ කටයුතු වලට අමතරවය.

එහි අනෙක් ප්‍රවේශය වන්නේ ආබාධසහිත පුද්ගලයන්ගේ ඡන්ද භාවිතයට අදාල පහසුකාරකත්වය සැපයීම මෙන්ම කාන්තාවන්ට එරෙහිව මැතිවරණ සමයේදී සිදුවන ප්‍රචණ්ඩක්‍රියා පිළිබඳ සුවිශේෂී අවධානයක් යොමු කිරීමයි. ඊට අමතරව මෙවර මැ.ප්‍ර.නි.ම මැතිවරණ නිරීක්ෂණයේ එක් ප්‍රධාන කාර්යයක් වන්නේ මැතිවරණ ප්‍රචාරක වියදම් මෙන්ම පොලිතීන් භාවිතය ඡන්ද විමසීම පැවැත්වෙන කාලසමය තුළ සිදුවන්නේ කවර ආකාරයෙන් ද යන්න පිළිබඳ විමසිලිමත් වීමත් ඊට අදාළ මූලික දත්ත හා තොරතුරු එක් රැස් කිරීමත් ය. ඊට පරිබාහිරව ප්‍රධාන ධාරාවේ මාධ්‍ය මෙන්ම සමාජ ජාලා මාධ්‍ය උපයෝගි කර ගනිමින් මැ.ප්‍ර.නි.ම මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලියට අදාළව තොරතුරු, නිවේදන හා වාර්තා ආදිය ඡන්දදායකයන් වෙත නිතිපතා මුදාහැරීම අඛණ්ඩව සිදුකිරීමට සැළසුම්කර ඇත.